කොවිඩ්-19 සම්බන්ධ වාර්තාකරණයන්හිදී ඇතැම් මාධ්‍ය මගින් කොවිඩ්-19 ආසාදිතයන් සම්බන්ධයෙන් සමාජය තුළ කොන් කිරීමේ හැඟීමක්, ගර්හාමය ආකල්පයක් ඇති වන ආකාරයෙන් පුවත් වාර්තාවන් ඉදිරිපත් කරනු දැකිය හැක. ඇතැම් විට කොවිඩ්-19 ආසාදිතයන් හඳුන්වා දීම සඳහා යොදාගන්නා යෙදුම් ඔස්සේද එවැනිම කොන් කිරීමක්, ගර්හාවක් ඇති වීමට ඉඩ තිබෙනා බව නොසලකා හැරිය හැකි නොවේ.

ඊට උදාහරණයක් ලෙසින් අරුණ පුවත්පතේ (12/11) ලිපියක සිරතලයේ සඳහන් "කොරෝනා කතක්" යන යෙදුම දැක්විය හැක. අරුණ පුවත්පත ආසාදිත පුද්ගලයා සම්බන්ධයෙන් එසේ සඳහන් කරන විට, මව්බිම පුවත්පතේ (12/11) එම සිදුවීම සම්බන්ධයෙන්ම පළවන පුවත් වාර්තාවේ අදාළ පුද්ගලයා සම්බන්ධයෙන් වඩාත් නිවැරදිව සඳහන් කෙරෙන්නේ "ආසාදිත කාන්තාවක්" යනුවෙනි.

මේ අනුව බලන විට, අරුණ පුවත්පතේ සඳහන් වන "කොරෝනා කතක්" වැනි යෙදුම්, කොවිඩ්-19 ආසාදිතයන් කෙරෙහි කොන් කිරීමේ ආකල්පයක් සමාජය තුළ ඇති කිරීමට දායක වෙතැයි ඔබ නොසිතන්නේද? එසේම එය කොවිඩ්-19 ආසාදිත අයවලුන්ගේ පුද්ගල ගරුත්වයට පවා හානියක් නොවේද?

**#COVID19 #Media #lk #MediaEthicsSL #lka#SinhalaNews #Mawbima #Aruna**